ප.පා.කො.චක්‍රලේඛ අංක- CLG/LG/1/5/2018/14

360

මගේ අංකය CLG/LG/5/3/1,
පළාත් පාලන කොමසාරිස් කාර්යාලය,
සබරගමුව පළාත් සභාව,
නව නගරය,
රත්නපුර.
2018.12.17

සබරගමුව පළාතේ,
සියලුම පළාත් පාලන ආයතන ප්‍රධානීන් වෙත.

**අක්කර බදු / වරිපනම් බදු සඳහා කේ පෝරම ලිවීම,පරීක්ෂා කිරීම හා බෙදීම සඳහා සංශෝධිත නව ගාස්තු.**

අක්කර බදු / වරිපනම් බදු සඳහා කේ පෝරම ලිවීම,පරීක්ෂා කිරීම හා බෙදීම සඳහා සංශෝධිත නව ගාස්තු සම්බන්ධයෙන් වන චක්‍රලේඛය නිකුත් කර මේ වන විට වසර 10 ක පමණ කාලයක් ගතවී ඇත.එමෙන්ම ඉහත කටයුතු ඉටු කිරීම මේ වන විට පරිගණක තාක්ෂණය යටතේ ද සිදුකරනු ලැබේ.එබැවින් මේ සම්බන්ධව මීට පෙර ම විසින් නිකුත්කර ඇති අංක 01/2008 හා 2008.04.17 දිනැති චක්‍රලේඛයේ සඳහන් කරුණු සංශෝධනය කර මෙම චක්‍රලේඛය නිකුත් කරනු ලබන අතර ඒ අනුව අවශ්‍ය කටයුතු කරන ලෙසට මෙයින් උපදෙස් දෙමි.මෙම චක්‍රලේඛය නිකුත් කරනු ලබන්නේ සබරගමුව පළාතේ ගරු ආණ්ඩුකාරතුමියගේ අනුමැතිය මත වේ.

I. ගාස්තු සංශෝධනය කිරීම.

- වරිපනම් බදු / අක්කර බදු තක්සේරු දැන්වීම් ලිවීම — රු.4.00
- වරිපනම් බදු / අක්කර බදු තක්සේරු දැන්වීම් පරීක්ෂා කිරීම — රු.2.00
- වරිපනම් බදු / අක්කර බදු තක්සේරු දැන්වීම් බෙදීම (එක් ඒකකයකට) — රු.8.00
- වරිපනම් බදු / අක්කර බදු ලේඛන ලිවීම (එක් ඒකකයකට) — රු.2.00
- වෙළඳ බලපත්‍ර ලේඛන ලිවීම (එක් ඒකකයකට) — රු.2.00
- ආදායම් පරීක්ෂකවරු නොමැති පළාත් පාලන ආයතනවල බලපත්‍ර ගාස්තු ඉල්ලුම්පත් ලබා ගැනීම (එක් ඒකකයකට) — රු.8.00

II. වරිපනම් බදු හෝ අක්කර බදු ලේඛන වල සඳහන් තොරතුරු නව පරිගණක මෘදුකාංගයකට ඇතුලත් කරන අවස්ථාවකදී පමණක් නව ලේඛන ලිවීම කරන අවස්ථාවක් ලෙස සලකා අදාළ ගෙවීම් කිරීම.

III. පරිගණක මගින් නව කේ පෝරම මුද්‍රණය කරන අවස්ථාවකදී මෙම ගෙවීම් නොකළ යුතුය.

IV. මෙම ගාස්තු ගෙවීම සිදුකළ ද, මෙම රාජකාරි අදාළ විෂය භාර නිලධාරීන්ගේ හා ආදායම් පරීක්ෂක වරුන්ගේ රාජකාරියේ කොටසක් වන බැවින්,ඔවුන් අදාළ රාජකාරි වගකීමෙන් හා කාර්යක්ෂමව ඉටුකළ යුතුය.

V. ඉහත ගෙවීම්වලදී වරිපනම හා අක්කර බදු තක්සේරු දැන්වීම් ලිවීමේ ගාස්තුව එම දැන්වීම් පරිගණක මගින් ලබා ගන්නා ආයතන වලට අදාළ නොවේ.

CamScanner

354

VI. අක්කර බදු / වරිපනම් බදු සඳහා කේ පෝරම ලිවීම,පරීක්ෂා කිරීම හා බෙදීමට,බලපත්‍ර ගාස්තු ලේඛන ලිවීම,ඉල්ලුම්පත් ලබා ගැනීමට අදාළව විවිධ අවස්ථා වලදී කරන ඉල්ලීම අනුව ඔබ වෙත නිකුත් කර ඇති ලිපි හා උපදෙස් (මේ දක්වා ගෙන ඇති ක්‍රියා මාර්ග වලට අගතියක් නොවන පරිදි) මෙම චක්‍රලේඛය නිකුත් කරනු ලබන දිනයේ සිට අවලංගු කරනු ලැබේ.

VII. මෙම ගාස්තු අනුව ගෙවීම් කිරීමට පෙර මහා සභාවට ඉදිරිපත් කර, සභාවේ අනුමැතිය ලබාගත යුතු බවද වැඩි දුරටත් දන්වා සිටිමි.

VIII. මෙම චක්‍රලේඛය 2019/01/01 දින සිට ක්‍රියාත්මක කරනු ලැබේ.

ඒ.එස්.ජේ.ගො...ැල්ලවත්ත,<br>
පළාත් පාලන කොමසාරිස්,<br>
සබරගමුව පළාත.

ඒ. එස්. ජේ. ගොඩැ...<br>
පළාත් පාලන කො...<br>
සබරගමුව පළා...

පිටපත් -

01.ප්‍රධාන ලේකම්,සබරගමුව පළාත. - කාරුණික දැනගැනීම සඳහා

02.ලේකම්,ප්‍රධාන අමාත්‍යාංශය,සබරගමුව පළාත. - කාරුණික දැනගැනීම සඳහා

03.පළාත් පාලන සහකාර කොමසාරිස්,රත්නපුර / කෑගල්ල - කාරුණික දැනගැනීම සඳහා

CamScanner